ටවර් හෝල් රඟහල පදනම - 2017

-------------------------------------

ටවර් හෝල් රඟහල පදනමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1978 අංක 01 දරන ටවර් හෝල් රඟහල පදනම පනතේ 12 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**
---------------

**2.1** **තත්ත්වාගණනය කළ මතය**
-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ටවර් හෝල් රඟහල පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**
-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**
----------------------------------------------

(අ) ප්‍රමිතයේ 49 ඡේදය පරිදි දේපල, පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපල, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, පිරිවැය රු.275,000,000 ක් වූ පදනම සතු ප්‍රධාන කාර්යාලයීය ඉඩම පමණක් 2016 සැප්තැම්බර් මාසයේදී රු. 614,000,000 ක ට ප්‍රත්‍යාගණනය කර තිබුණ ද පිළිවෙලින් පිරිවැය රු.123,000,000 ක් සහ රු.205,000,000 ක් වූ ටවර් හෝල් ඉඩම සහ සරසවිපාය ඉඩම ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 65 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.366,411,129 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ ප්‍රතිපත්ති**
----------------------

2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය රු.555,334,448 ක් වූ අතර එම ප්‍රදානවලින් මිලදී ගෙන තිබූ වත්කම්වලට අදාල ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායමට හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පදනම විසින් හඳුනාගෙන නොතිබුණි.

**2.2.3** **ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් කොන්ත්‍රාත් වෙනුවෙන් ගෙවූ අතුරු ගෙවීම් රු.88,704,638 ක් සහ රඳවාගත් මුදල් රු.4,598,165 ක් ඉදිකරමින් පවතින වැඩ ගිණුම හර කිරීම වෙනුවට අත්තිකාරම් ගිණුම හර කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේ දී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් රු. 163,000,000 කට තක්සේරු කරන ලද ගොඩනැගිල්ලෙහි ප්‍රත්‍යාගණන වටිනාකම 2017 වර්ෂයේ දී ගිණුම්ගත කිරීමේ දී රු. 1,250,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | මුදල් පරිත්‍යාග | **18,577,319** | **ලදුපත්, බැංකු තැන්පතු පත්‍රිකා,** |
| (ආ) | භාණ්ඩ පරිත්‍යාග | **58,890,541** | **භාණ්ඩ ලැබීම් පත්‍රිකා, පරිත්‍යාග ලේඛනය** |

**2.3 ලැබිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසාන දිනට වෙනත් ලැබිය යුතු ගිණුමේ ශේෂය රු. 4,604,413 ක් වූ අතර ඉන් වසරකට වඩා හිඟව පැවති ශේෂය රු.690,770 ක් විය. එම වටිනාකම තුළ 2014 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අනුමැතියකින් තොරව හිටපු අධ්‍යක්ෂවරයෙකුට ගෙවන ලද රු. 350,630 ක ඉන්ධන දීමනා මුදලක් ද විය.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 9,769,555 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.17,552,384 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,321,939 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු.11,517,000 කින්, මෙහෙයුම් ආදායම් රු.2,743,460 කින් හා වෙනත් ආදායම් රු.15,444,154 කින් වැඩිවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම අඛණ්ඩව ඌනතාවයක් ඇතිවී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් නැවත ගැළපීමේදී 2013 වර්ෂයේ රු.28,695,875 ක්වූ දායකත්වය 2014 වර්ෂයේදී රු.26,376,128 ක් දක්වා අඩු වී තිබූ නමුත් නැවතත් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.31,686,774 ක සිට රු.57,915,183 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

අගනුවර මෙන්ම පිටතදීත් නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයින්ට එක හා සමාන රසවින්දනයක් ලැබිය හැකි, නූතන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි නවීකරණය වූ රංග ශාලා ජාලයක් රටපුරා ඇතිකිරීම සහ ශ්‍රී ලාංකේය සම්ප්‍රදායික දේශීය ජන නාට්‍ය සම්ප්‍රදායන්හි සංරක්ෂණය කළයුතු

නිර්මාණ අනාගත පරපුර සඳහා සුරක්ෂිත කිරීම හා සංරක්ෂණය කිරීම යන අරමුණු සංයුක්ත සැලැස්මේ ඇතුලත්ව තිබූ නමුත් එයට අනුගත වෙමින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, ඉටු කිරීමට සැළසුම්කළ වැඩසටහන් / ව්‍යාපෘති 21 කින් ඇස්තමේන්තුගත පිරිවැය රු.2,550,000 ක් වූ වැඩසටහන් / ව්‍යාපෘති 03 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණි. තවද ක්‍රියාත්මක කළ වැඩසටහන් / ව්‍යාපෘති 03 ක භෞතික ප්‍රගතිය සියයට 16 සිට සියයට 41 දක්වා අවම මට්ටමක පැවතුණි.

(ආ) පදනමේ ටවර් හා රංග කලා පාසල විසින් දෙවර්ෂ පූර්ණ කාලීන නාට්‍ය හා රංගන කලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා 2012 වර්ෂයේ බඳවාගත් සිසුන් සංඛ්‍යාවට සාපේක්ෂව 2017 වර්ෂයේ සිසුන් සංඛ්‍යාව 23 සිට 69 දක්වා වැඩිකර තිබුණි. 2012 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ පාඨමාලා ගාස්තුවද රු.50,000 සිට රු.85,000 දක්වා වැඩිකර තිබුණි. එසේ වාර්ෂිකව සිසුන් සංඛ්‍යාව වැඩි වුවද සිසුනට අවශ්‍ය දේශන ශාලා පහසුකම්, පුස්තකාල පහසුකම්, ප්‍රායෝගික අභ්‍යාස ශාලා පහසුකම්, සනීපාරක්ෂක සේවා පහසුකම්, පරිගණක පහසුකම්, සැරසුම් කාමර පහසුකම්, විවේකාගාර පහසුකම්, නේවාසිකාගාර පහසුකම් හා ආපනශාලා පහසුකම් යනාදිය ප්‍රමාණවත් අයුරින් සම්පූර්ණ කර නොතිබුණි. ඒ අනුව පනතේ අරමුණු කරා ළඟාවීමට හැකිවන සේ ටවර් නාට්‍ය හා රංගන කලා පාසල කඩිනමින් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය කළමනාකරණයේ අවධානයට යොමු වී නොතිබුණි.

## 4.2 වෙනත් ආයතන වෙත ලබාදුන් පදනමේ සම්පත්

පදනමේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන දෙමහල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 32000 ක පමණ ප්‍රමාණයක් වූ එක් මහලක් ගිවිසුමකට එළඹීමකින් තොරව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත 2016 මැයි 16 දින සිට කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා ලබාදී තිබුණි. 2018 සැප්තැම්බර් 15 දින දක්වාම ගොඩනැගිල්ල භාවිතා කිරීම වෙනුවෙන් එම අධිකාරිය වෙතින් කුලියක් අයකර ගෙන නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 91 ක් වුවද එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 65 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 26 ක් විය. මෙසේ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පැවතීම පදනමේ විවිධ අංශවල කටයුතු ඵලදායීව ඉටුකිරීමට බාධාවක් වී තිබුණි.

(ආ) පදනමේ අනුමත තනතුරක් වූ අධ්‍යක්ෂ පාලන හා සංවර්ධන තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවාගැනීමට කටයුතු නොකර වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත අවුරුදු 60 ඉක්මවූ නිලධාරියකු 2015 නොවැම්බර් මාසයේ සිට බඳවාගෙන එම කොන්ත්‍රාත් කාලය වාර්ෂිකව දීර්ඝ කරමින් 2018 අප්‍රේල් මාසය දක්වාම සේවයේ යොදවා තිබූ අතර එකතුව රු.1,495,247 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 (iv) ඡේදයට පටහැනිව වැඩ බැලීමේ කාලය මාස 03 ඉක්මවා අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරු (රුක්මණී දේවි රඟහල), කළමනාකරු (එල්ෆින්ස්ටන් රඟහල) සහ සම්බන්ධීකරණ නිලධාරී (පාඨමාලා) යන තනතුරු 04 සඳහා මෙම වාර්තාවේ දින වන විටත් මාස 06 සිට අවුරුදු 1 යි මාස 11 ක් දක්වා වැඩ බැලීමට පත්කර තිබූ අතර 2017 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.448,638 ක වැඩබැලීමේ දීමනා ගෙවා තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව පදනම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව පදනම විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගෙන නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 උප වගන්තිය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 6 දින 05 ක ප්‍රමාදයකින් පසුව 2018 සැප්තැම්බර් 05 දිනදීය.

**6.2 අභ්‍යන්තර විගණනය**

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව පදනමේ අභ්‍යන්තර පාලනය හා අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ පරීක්ෂාවන් පවත්වාගෙන යෑම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතුවුවත්, සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර අභ්‍යන්තර විගණනයක් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද අභ්‍යන්තර විගණක තනතුර පිරවීම සඳහා 2011 ජූලි 20 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණද, 2018 සැප්තැම්බර් 15 දින වන විටද එම තනතුර පුරප්පාඩුව පැවතුණි.

**6.3 විගණන කමිටු**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව සෑම කාර්තුවකටම වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද 2016 සහ 2017 වර්ෂ තුළ රැස්වීම් පවත්වා නොතිබුණි.

## 6.4 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එල්ෆින්ස්ටන් රඟහල නවීකරණ කිරීමේ කටයුතු නිම කිරීමට පෙර එහි ස්ථාපිත කිරීම සඳහා ආසන 700 ක් සපයා සවිකිරීම වෙනුවෙන් රු.11,400,000 ක සැපයීමේ ගිවිසුමකට එළඹ තිබූ අතර එයින් රු.9,019,794 ක් ගෙවා පුටු මිලදීගෙන තිබුණි. කෙසේවුවද, මිලදීගත් පුටුවල ආරක්ෂාව සහ වගකීම සැපයුම්කරු විසින් භාර නොගන්නා බව සැපයුම්කරුගේ 2016 පෙබරවාරි 16 දිනැති ලිපිය මගින් පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී තිබුණි.

(ආ) එල්ෆින්ස්ටන් රඟහල සඳහා වායු සමීකරණ පද්ධතියක් ප්‍රසම්පාදනය කරගැනීම වෙනුවෙන් 2018 අප්‍රේල් 02 දින වන විට රු.15,244,049 ක් ගෙවා තිබුණි. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුකරුට අවශ්‍ය වන උචිත සහ අදාල මූලික තොරතුරු ලංසු කැඳවීමේ ආරාධනයේ ඇතුළත් විය යුතු වුවත් මෙම ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් 2015 පෙබරවාරි 27 දින පළ කරන ලද පුවත්පත් නිවේදනය අනුව වායු සමීකරණ පද්ධතියක් සැපයීම, සවිකිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් ප්‍රසම්පාදනයේදී අවධානය දක්වා තිබූ නමුත් එහි අළුත් වැඩියා සහ නඩත්තු කටයුතු සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි. ඒ හේතුවෙන් එම යන්ත්‍රයේ අළුත් වැඩියා, නඩත්තු හා සේවා කටයුතු වෙනුවෙන් නැවතත් මුදල් වැයකර ප්‍රසම්පාදන කාර්යයන් සිදුකළ යුතුව පැවතුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින්වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ප්‍රාග්ධන ප්‍රදාන හා දේපළ, පිරියත, උපකරණ නිවැරදිව ගිණුම් ගත නොකිරීම, ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු පිරවීම සඳහා ස්ථිර නිළධාරීන් බඳවා නොගැනීම හා දීර්ඝ කාලයක සිට ඇතැම් තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් සේවයේ යොදවා තිබීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | ඇතැම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම, ඉදිකිරීමේ කොන්ත්‍රාත් අදාළ කාලය තුළ නිමකිරීමට අපොහොසත් වීම, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා පැවතීම. |
| (ඈ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම |